# ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ LEED+ ව්‍යාපෘතිය, සිලෝන් බිස්කට්ස් සහ ඇල්ලි ෆුඩ්ස් සමාගම් සමගින් පුද්ගලික අංශය සමඟ සහයෝගීතාව ප්‍රවර්ධනය කරයි

## කොවිඩ් -19 වසංගතය තුළ ජීවනෝපායයන්ට සහය ලබා දීම තුළින් සැපයුම් දාම ශක්තිමත් කිරීම

**2020 නොවැම්බර් 4, කොළඹ**: ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ආර්ථික සංවර්ධනය සහ සංහිඳියාව තුළින් ජනතාව සවිබලගැන්වීමේ (LEED+) ව්‍යාපෘතිය, වෙළෙඳපොළ පද්ධති සංවර්ධන එළඹුම තුළින් උතුරු පළාත තුළ ආර්ථික වර්ධනයට උත්තේජනයක් ලබාදීමේ උපාය මාර්ගවල කොටසක් ලෙස, සිලෝන් බිස්කට්ස් සමාගම සහ ඇල්ලි ෆුඩ්ස් සමාගම සමග හවුල්කාරීත්වයකට එළැඹිණි. මෙම හවුල්කාරීත්වයන් කොවිඩ් -19 මගින් හානියට පත් ගෝලීය සහ ප්‍රාදේශීය සැපයුම් දාම වෙත පමණක් නොව ස්වයංපෝෂිත ආර්ථිකයක් ළඟා කරගැනීමේ ලා දේශීයව කෘෂිකාර්මික බෝග නිපැයුම කෙරෙහි ශ්‍රී ලංකා රජයේ ඉලක්ක කෙරෙහි දක්වන කාලීන ප්‍රතිචාරයක් වෙයි.

වේගයෙන් වර්ධනය වන ආර්ථිකය තුළ, පුද්ගලික අංශය (මිලදී ගන්නන් හෝ සැපයුම්කරුවන් ලෙස) නව වෙළෙඳපොළවල් වෙත ආක්‍රමණශීලී ලෙස ප්‍රවේශ වීමට උත්සහ දැරිය යුතු වුවත් මන්දගාමීව ඉදිරියට යන උතුරු පළාත සඳහා එය වලංගු නොවේ. අවශ්‍ය කුසලතාවන්, වෙළෙඳපොළ තොරතුරු නොමැතිකම මෙන්ම ප්‍රාදේශීය නිෂ්පාදකයන්ට සහ ව්‍යාපාරවලට දැරිය හැකි මූල්‍ය විකල්ප නොමැති වීම නිසා උතුරු පළාතේ ව්‍යාපාරික කටයුතු නිරතුරුවම අධි අවදානම් තත්ත්වයක පසුවෙයි. මෙමගින් ජාතික තලයේ විශාල ව්‍යාපාරිකයන්ගේ ආයෝජනයන් නිෂේධනය වී යයි. කෙසේ වෙතත්, පුද්ගලික අංශයට සහය දැක්වීමක් ලෙස LEED+ හි මැදිහත්වීම හරහා වාණිජමය ශක්‍යතාවයක් සහිතව මෙම පරතරයන් පියවා ගැනීමට සමාගම්වලට උපකාර ලැබෙන අතර ව්‍යාපාරික අවදානම බෙදා ගැනීම තුළින් ව්‍යාපාරිකයා හා ප්‍රාදේශීය ප්‍රජාවන් යන දෙපාර්ශ්වයටම වාසි සහගත තත්ත්වයක් උදා වෙයි.

දේශීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ ප්‍රවේශස්ථානයක් ලෙස ව්‍යාපෘතියේ ආංශික එළඹුම යොමු වන්නේ කෘෂිකර්මය සහ ධීවර කර්මාන්තය වෙතට යි. රටකජු, පොල් ලෙලි සහ මුහුදු කැකිරි යන අගය දාමයන් තුන සමග සම්බන්ධ වීමෙන් LEED+ දැනටමත් පුද්ගලික අංශයේ සමාගම් කිහිපයක් වන ඩේවිඩ් ග්‍රේම්, ගුයි-ලැන්, හේලීස් සහ ඒරොපිකොයර් යන සමාගම් සමග සාර්ථක හවුල්කාරීත්වයක් ස්ථාපනය කරගැනීමට සමත්ව ඇත. පිළිවෙළින් බඩ ඉරිඟු සහ කළු කව්පි යන නව අගය දාමයන් ගවේෂණය සඳහා සිලෝන් බිස්කට්ස් සමාගම සහ ඇල්ලි සමාගම සමග මෙම ව්‍යාපෘතිය නවතම හවුල්කාරීත්වයක් ඇති කරගනු ලැබීය. LEED+ විසින් සිදු කළ විස්තීර්ණ අධ්‍යයනයකින් අනාවරණය වූයේ මෙම බෝගයන් දෙක හරහාම රැකියා අවස්ථා ජනනය මෙන්ම ප්‍රාදේශීය ප්‍රජාවන්ට විශේෂයෙන් කාන්තාවන් හට ආදායම් මාර්ගයක් සකසා දීමේ ශක්‍යතාවය පවතින බවයි.

නව හවුල්කාරීත්වය සම්බන්ධව අදහස් දැක්වූ සිලෝන් බිස්කට් පුද්. සමාගමේ කෘෂිව්‍යාපාර සංවර්ධන අධ්‍යක්ෂ ආචාර්ය රුක්ෂාන් ගුණතිලක මෙසේ පවසා සිටියේය, "උතුරු පළාතේ ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම සහ ගොවියන් සඳහා ස්ථාවරත්වයක් නිර්මාණය කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙම මූලාරම්භය සමග හවුල්කාරීත්වයක් ඇති කරගැනීමට හැකිවීම අපගේ භාග්‍යයකි. මෙම ප්‍රාදේශීය ගොවි ප්‍රජාවට පුද්ගලික අංශයේ මැදිහත්වීම සහ සහයෝගය මෙන්ම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ විශේෂඥණය ලබා දීම ශ්‍රී ලංකාවේ ආහාර සැපයුම් දාමය ශක්තිමත් කරනු ඇති අතරම උතුරු පළාතෙන් කෘෂිකර්මයට ලැබෙන ආර්ථික දායකත්වය වැඩි කරමින් සිලෝන් බිස්කට්ස් සමාගමට දේශීයව නිෂ්පාදනය කළ උසස් තත්වයේ කෘෂිකාර්මික නිෂ්පාදන අඛණ්ඩව මිලට ගැනීමට හැකියාව ඇති කරනු ඇත."

"කෘෂිකාර්මික අමුද්‍රව්‍ය ආනයනය කිරීම අධෛර්යයට පත් කිරීම සහ කොවිඩ්-19 හේතුවෙන් සැපයුම් දාමයන්ට ඇතිව ඇති හානිය අපගේ පද්ධතීන්ටද යම් තර්ජනයක් ඇති කරන තත්ත්වයක් තුළ මෙම හවුල්කාරීත්වය නිවැරදි විසඳුමකි. යෝජිත ව්‍යාපාර මාදිලිය, සමාගම සහ ගොවියන් වෙත අඛණ්ඩව ප්‍රතිලාභ ලැබෙන ආකාරයට අවස්ථාවන් නිර්මාණය කරයි. ගොවි සමිති සෘජුවම සමාගම හා සම්බන්ධ කිරීම තුළින් අතරමැදියන් හරහා කෙරෙන අවභාවිතයන් වැලකී යන අතරම සාධාරණ මිලකට ඉහළ අස්වැන්නක් ලබාගැනීමට මෙම බෝගයන් වගා කිරීමට ගොවියන් දිරිමත් කරනු ලැබේ. උතුරු පළාතේ මෙම වෙළෙඳ ද්‍රව්‍ය සංවර්ධනයෙහි ලා සහ මෙයට සම්බන්ධ වන පවුල්වල ජීවන තත්වය උසස් කිරීමේ ලා වන විශාලතම සම්පත වන්නේ ගොවියන් වෙත දැනුම ලබාදීමයි' යනුවෙන් ඇල්ලී පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ඉලීන් රිලුවාන් මහතා ප්‍රකාශ කළේ ය.

පුද්ගලික අංශය සමග සම්බන්ධ වීමේ LEED+ එළඹුම පිළිබඳව අදහස් දක්වමින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් කාර්යාලයේ අධ්‍යක්ෂිකා සිම්රින් සිං මහත්මිය මෙසේ පවසා සිටියා ය, "වෙළෙඳපොළ පද්ධති සංවර්ධනය, කෙටි කාලීන ජයග්‍රහණයන් මෙන්ම දිගු කාලීන විසඳුම් ද ලබා දෙයි. එය උතුරු පළාතේ නිෂ්පාදකයන් සහ පුද්ගලික අංශය අතර සම්බන්ධතාව ගොඩ නගමින් එමගින් ඇති කරන රැකියා සහ ජීවනෝපායන් තිරසර බවට පත් කරයි. අවශ්‍ය සහය සේවාවන්, දැනුම් ආදාන සහ වෙළෙඳපොළ සම්බන්ධතාවලට අත්‍යවශ්‍ය පාරිසරික පද්ධතියක් නිර්මාණය කිරීමෙන් මෙම රැකියා අවස්ථාවන් ඉදිරියේදී පවා අඛණ්ඩව පවතිනු ඇත."

ව්‍යාපාරයන් එහි බිම් මට්ටමේ ප්‍රජාවන් සමග සම්බන්ධ කිරීමට අවස්ථාවන් ඇති කිරීමෙන් සහ පහසුකම් සැපයීමෙන් LEED+ එහි ඵල සියලුම දෙනා අතර බෙදා හරින අතර සියලු දෙනාට ඉදිරියට ගමන් කිරීමට උපකාර කරනු ඇත.

*ඔස්ට්‍රේලියානු සහ නෝර්වේ රජයේ සහය ඇති LEED+ ව්‍යාපෘතිය ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සාමය සහ සංහිඳියාව සඳහා වන ගෝලීය රැකියා වැඩසටහනේ කොටසකි. සෑම අයුරකින්ම LEED+ යනු ජාත්‍යන්තර කම්කරු*

*සංවිධානයේ පරමාදර්ශී ව්‍යායාමයක් වන අතර එහි අරමුණ වන්නේ, සියලු දෙනා ඇතුළත් වන සුණිසි රැකියා නිර්මාණය කිරීම සහ එම ක්‍රියාවලියේදී ගැටුම්වලින් බලපෑම් ලත් ප්‍රජාවන් සවිබල ගැන්වීම සහතික කිරීමයි.*